මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අතුරු වෛද්‍ය සේවා ගණය (MT-5-2016) පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරු සඳහා වන උසස් කිරීමේ පරිපාටිය.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 මගින් හඳුන්වා දී ඇති නව වැටුප් ප්‍රතිපත්තියට අනුකූලව මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ අතුරු වෛද්‍ය සේවා ගණයෙහි (MT-5-2016) පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරු සඳහා මෙම උසස් කිරීමේ පරිපාටිය මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කළ දින සිට මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන තුළ ක්‍රියාත්මක වේ.

මෙම උසස් කිරීමේ පරිපාටිය අනුමත වන දින සිට, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 1998.04.02 දිනැතිව අනුමත කර ඇති 1992.06.03 දින සිට ක්‍රියාත්මක පැවති බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ විධිවිධාන අනුව ගෙන ඇති තීරණයන්ට අගතියක් නොවන පරිදි, එම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අවලංගු කරනු ලැබේ.

මෙම තනතුර සඳහා බඳවා ගැනීම මධ්‍යම රජය විසින් සිදු කරන අතර, පසුව පළාත් රාජ්‍ය සේවය සඳහා අන්තර්ග්‍රහණය කර යොමු කිරීමෙන් පසු මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් පත්වීම් ලිපි නිකුත් කරනු ලැබේ.

01. සම්බන්ධ වන ආයතනය

1.1 දෙපාර්තමේන්තුව : මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුව.
යොමු අංකය: CPC/CLG/1/2/3/1(II)
දිනය: 2022.09.08

1.2 අමාත්‍යාංශය : මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය.
යොමු අංකය: CPC/CMS/01/07/07
දිනය: 2022.09.16

1.3 ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය : යොමු අංකය: CPC/CS/2/7/SOR/CLG6/2022
දිනය: 2022.10.04

1.4 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය. : යොමු අංකය: DMS/D/පොදු/11-2
දිනය: 2012.12.19

1.5 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය : යොමු අංකය: EST-2/06/CP-REC/0240
දිනය: 2024.08.06

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය : යොමු අංකය: CPC/PSC/CLG/Midwife/SOR
දිනය:2025.03.18

1.7 මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය : යොමු අංකය: GCP/04/ස.ව.ලං/ව.නි.ශා
දිනය: 2025.04.03

02. පත්කිරීමේ බලධරයා : මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් බලය පවරන ලද මධ්‍යම පළාත් සභාවේ, ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්.

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : අතුරු වෛද්‍ය සේවා ඛණ්ඩ - 02

3.2 ශ්‍රේණි : III, II, I, අධි ශ්‍රේණිය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2025-04-03 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේ...

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය:
පූර්ව ප්‍රසව සංරක්ෂණය, අන්තර් ප්‍රසවය හා පසු ප්‍රසව සංරක්ෂණය යන ක්ෂේත්‍රයන් තුළ ගුණාත්මක වූත්, සානුකම්පිත වූත් සේවාවක් සපයමින් මාතෘ හා ළමා සෞඛ්‍ය සංවර්ධනය මූලික කොට සෞඛ්‍ය අධ්‍යාපනය ලබාදීම.

3.4 කාර්යයන් පැවරීම :ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතා සඳහාම නොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධාරිනියකට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

04. **තනතුරෙහි / තනතුරුවල ස්වභාවය** : ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය
(සටහන - විශ්‍රාම වැටුප් පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය.)

05. වැටුප්
5.1. වැටුප් කේත අංකය : MT- 5-2016
5.2. මාසික වැටුප් පරිමාණය ;රු.31,635 -10x 445-11x 660-10x 730 -10x 750 - රු.58,145/-
5.3. ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාළ මාසික වැටුප් පියවර :

ශ්‍රේණිය	ආරම්භක වැටුප් පියවර	ආරම්භක වැටුප් තලය (රු.)
III	පියවර 01	31,635/-
II	පියවර 12	36,745/-
I	පියවර 23	44,075/-
අධි ශ්‍රේණිය	පියවර 34	52,145/-

06. **සේවා ගණයට අයත් තනතුරු**
6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් (උපලේඛන - 1)
6.2 ඒකාබද්ධ නිලධාරි සංඛ්‍යාව:

- පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී - 50
- ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I, අධි ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධාරි සේවක සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

07. **බඳවා ගැනීමේ ක්‍රමය** : දැනටමත් මෙම තනතුර සඳහා බඳවා ගැනීම මධ්‍යම රජය විසින් සිදු කරන බැවින් බඳවා ගැනීමේ ක්‍රමයට අදාළ කරුණු අදාළ නොවේ.

08. **කාර්යක්ෂමතා කඩඉම්**
8.1

කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග	කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද	කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය/ ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය /සහතික පාඨමාලාව/වෙනත්.
1 වන කාර්යක්ෂමතා කඩඉම.	III ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03) ක් ගත වීමට පෙර.	ලිඛිත පරීක්ෂණයකි. (උපලේඛන - 2)
2 වන කාර්යක්ෂමතා කඩඉම.	II ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගතවීමට පෙර.	ලිඛිත / වාචික සහ ප්‍රායෝගික පරීක්ෂණයකි. (උපලේඛන -3)
3 වන කාර්යක්ෂමතා කඩඉම.	I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගතවීමට පෙර.	ලිඛිත පරීක්ෂණයකි. (උපලේඛන - 4)

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025 - ... 02 ... දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද? වර්ෂයකට දෙවරක්.

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද?

1 වන කාර්යක්ෂමතා කඩඉම - රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්.

2 වන කාර්යක්ෂමතා කඩඉම - රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්.

3 වන කාර්යක්ෂමතා කඩඉම - රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්.

සටහන: එක් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රශ්ණ සඳහා ඇතුලත් විය යුතු ප්‍රශ්න සංඛ්‍යාව, ඒවා ව්‍යුහගත ප්‍රශ්න/රචනාමය ප්‍රශ්න විය යුතු ද ,කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද යන්න රේඛීය සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත.

8.4.(අ) කාර්යක්ෂමතා කඩඉම විභාගය සඳහා විෂය නිර්දේශය.

රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ වලට අදාලව, අයදුම්පත් කැඳවනු ලබන නිවේදනවල සඳහන් පරිදි විය යුතුය.

එක් එක් බඳවා ගැනීම් පරිපාටිය යටතේ අනුරූපී වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂයන්	
පැරණි බඳවා ගැනීම් පරිපාටිය	නව උසස් කිරීමේ පරිපාටිය
(1) I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙපාර්තමේන්තු පරීක්ෂණය. ❖ විෂය ක්ෂේත්‍රයට අදාළ (ලිඛිත,වාචික,ප්‍රායෝගික) ❖ ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි	(1) I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය. ❖ ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති ❖ මුදල් රෙගුලාසි
(2) II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ❖ විෂය ක්ෂේත්‍රයට අදාළ ප්‍රශ්න පත්‍රය ❖ කාර්යාල පරිපාලනය, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි.	(2) II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ❖ විෂයානුබද්ධ (ලිඛිත,වාචික,ප්‍රායෝගික) ❖ ආයතන සංග්‍රහය. ❖ මුදල්රෙගුලාසි.
	(3) III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය ❖ විෂයානුබද්ධ (බහුවරණ) ❖ විෂයානුබද්ධ (ව්‍යුහගත රචනා)

(ආ) පැරණි බඳවා ගැනීමේ පරිපාටිය අනුව පළමු කාර්යක්ෂමතා කඩඉමෙහි ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විෂය සමත් නිලධාරින් මෙම උසස් කිරීමේ පරිපාටිය අනුව පළමු කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරනු ලැබේ.

(ඇ) මෙම උසස් කිරීමේ පරිපාටිය බලාත්මක වන දිනට පෙර පැවති බඳවා ගැනීමේ පරිපාටිවල විධිවිධාන යටතේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්විය යුතු නිලධාරිනියන්, පැවති බඳවා ගැනීමේ පරිපාටියට අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ එක් එක් විෂයන්ට අනුරූපී වන මෙම උසස් කිරීමේ පරිපාටිය යටතේ පැවැත්වෙන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂයයන් සමත් වීමෙන් දෙවන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ යුතු ය. අනුරූපී විෂයන් ඉහත සඳහන් වගුවෙහි දැක්වේ. පැරණි බඳවා ගැනීමේ පරිපාටිය අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් අනුරූපි විෂයන් සමත් වී ඇත්නම්, එම විෂයයන් පමණක් නව උසස් කිරීමේ පරිපාටිය යටතේ සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025..04..03... දින
අනුමත කරන ලදී

ආණ්ඩුකාර ලේකම්

(ඇ) නව උසස් කිරීමේ පරිපාටිය බලාත්මක වන දිනට I ශ්‍රේණියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරිනියන්, තුන්වන කාර්යක්ෂමතා කඩඉම් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

(ඉ) මෙහි උප ඡේද අංක (ඇ) හි සඳහන් පරිදි සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වෙනස් වුව ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉමට අදාළ වන දිනය වෙනස් නොවේ.

09. භාෂා ප්‍රවීණතාව

9.1

භාෂාව	ලබාගත යුතු ප්‍රවීණතාව
01. රාජ්‍ය භාෂාව	රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරිනියන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පත්වීම් දින සිට වසර 03ක් ඉකුත් වීමට පෙර ලබාගත යුතු ය.
02. අනෙක් රාජ්‍ය භාෂාව	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18 / 2020 හා ඊට අනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතු ය.

10. ශ්‍රේණි උසස් කිරීම.

10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව,

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

i. පත්වීම ස්ථිර කිරීම.
ii. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහය(10) ක් උපයාගෙන තිබීම.
iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය(10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
iv. උසස් කිරීමේ දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 1/2020 අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.
vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.

10.1.1.2 II ශ්‍රේණියට උසස් කිරීමේ ක්‍රමය:

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරිනියන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත් කිරීමේ බලධාරියා වෙත අදාළ නිලධාරිනිය විසින් නියමිත ආකෘති පත්‍ර අනුව (ආකෘති පත්‍ර අංක - 01) ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීමේ බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
....2022-04-23.... දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

10.2 II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

10.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව.

10.2.1.1. සපුරාලිය යුතු සුදුසුකම්:

i. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහය(10) ක් උපයාගෙන තිබීම.
ii. අනුමත කාර්ය සාධනය ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය(10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
iii. උසස් කිරීමේ දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 1/2020 අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම

10.2.1.2. I ශ්‍රේණියට උසස් කිරීමේ ක්‍රමය:

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරිනියන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත් කිරීම් බලධරයා වෙත අදාළ නිලධාරිනියන් විසින් (ආකෘති පත්‍ර අංක - 02) අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදුකරනු ලැබේ.

10.3 I ශ්‍රේණියේ සිට අධි ශ්‍රේණියට උසස් කිරීම.

10.3.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව,

10.3.1.1. සපුරාලිය යුතු සුදුසුකම්:

i. සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහය(10)ක් උපයාගෙන තිබීම.
ii. අනුමත කාර්ය සාධනය ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය(10)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
iii. උසස් කිරීමේ දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 1/2020 අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.

10.3.1.2. අධි ශ්‍රේණියට උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරිනියන් අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත් කිරීම් බලධරයා වෙත නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදුකරනු ලැබේ.

සංලක්ෂය - සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීමේ දී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් සමත් නොවන නිලධාරිණියන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම් සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කරනු ලැබේ.

11. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාල නොවේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025.04.03 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

12. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය

නව උසස් කිරීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 අනුව MT 5-2016 වැටුප් පරිමාණයෙහි වැටුප් ලබන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්, ප්‍රතිසංවිධිත අතුරු වෛද්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධාන ලෙස සලකා පහත පරිදි සිදු කරනු ලැබේ.

සේවයේ II "ආ" ශ්‍රේණියේ නිලධාරිනියන් නව උසස් කිරීමේ පරිපාටියේ III වැනි ශ්‍රේණියට ද,
සේවයේ II "අ" ශ්‍රේණියේ නිලධාරිනියන් නව උසස් කිරීමේ පරිපාටියේ II වැනි ශ්‍රේණියට ද,
සේවයේ I ශ්‍රේණියේ නිලධාරිනියන් නව උසස් කිරීමේ පරිපාටියේ I වැනි ශ්‍රේණියට ද, අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

"සේවයේ I ශ්‍රේණියේ වසර (10) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ I ශ්‍රේණියට අදාළ වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන ඇති නිලධාරිනියන් අධි ශ්‍රේණියට" අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

කෙසේ වුවත් අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ නිලධාරිනියගේ වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදුනොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය ලෙසම නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතු ය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ වැටුප් පියවරේ තැබීම ද නොකළ යුතු ය.

13. අන්තර්කාලීන විධිවිධාන.

13.1 ශ්‍රේණි උසස් කිරීම් විධිවිධාන

"වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවයේ හා අතුරු වෛද්‍ය සේවයේ I වන ශ්‍රේණියේ උසස් වීම් ලබාදීම" යන මැයෙන් ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2012.03.13 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2014.09.04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එළඹ ඇති තීරණය අනුව, 2010.11.01 දින සිට 2015.12.31 දින දක්වා අන්තර් කාලය ක්‍රියාත්මක වන අතර, 2020.02.11 දින මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලද රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ පොදු චක්‍රලේඛ අංක 01-57-/2019 මගින් අන්තර්කාලීන විධිවිධාන 2015.12.31 දින සිට 2020.12.31 දින දක්වා දීර්ඝ කර ඇත. එම අන්තර් කාලය තුළ II ශ්‍රේණියේ හා I ශ්‍රේණියේ උසස්වීම් පහත පරිදි ලබා දෙනු ඇත.

13.1.1 II "අ" බණ්ඩයට / II ශ්‍රේණියට උසස් කිරීම.

නිවාඩු කාලය ද ඇතුළුව II "ආ" බණ්ඩයේ/III ශ්‍රේණියේ වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණය හා කාර්යක්ෂමතා කඩඉම් සමත් නිලධාරිනියන් (II "අ" බණ්ඩයට) II ශ්‍රේණියට උසස් කරනු ඇත.

13.1.2 I ශ්‍රේණියට උසස් කිරීම.

II "අ" බණ්ඩයේ වසර 09 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත, මුල් පත්වීමේ දින සිට අවම වශයෙන් වසර 15 ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරිනියන්, හිඟ වැටුප්, අතිකාල දීමනා හා අනෙකුත් දීමනා ගෙවීමකින් තොරව සේවයේ I ශ්‍රේණියට උසස් කරනු ඇත.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
[illegible] දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

14. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිරව වන්නා වූ අර්ථ නිරූපණ හා නිර්වචන :

i. "ගරු ආණ්ඩුකාරතුමා "යන්නෙන් "මධ්‍යම පළාත් ආණ්ඩුකාරතුමා" අදහස් වේ.

ii. "කොමිෂන් සභාව" යන්නෙන් "මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව" අදහස් වේ.

iii. "පත්වීම් බලධරයා"යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ, පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් අදහස් වේ.

iv. "අමාත්‍යාංශ ලේකම්වරයා" යන්නෙන් "මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයා" අදහස් වේ.

v. "දෙපාර්තමේන්තු ප්‍රධානියා"යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ "පළාත් පාලන කොමසාරිස්" අදහස් වේ.

vi. "උසස් කිරීමේ පරිපාටිය" යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අනුෂ වෛද්‍ය සේවා ගණය (MT 5 -2016) පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරු සඳහා වන උසස් කිරීමේ පරිපාටිය අදහස් වේ.

vii. "සතුටුදායක සේවා කාලය" යනුවෙන් අදහස් කරන්නේ රජයේ නිලධරයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටුකිරීම මගින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩයිම් සමත්වීම මගින් ද, සිදු කළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 විධිවිධානයන්ට අනුකූලව දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේ ය.

viii. "සක්‍රීය සේවා කාලය" යනුවෙන් අදහස් කරන්නේ රජයේ, මධ්‍යම පළාත් සභාවේ හා පළාත් පාලන ආයතනවල උවමනාවන්ට හෝ/හා රජයේ, මධ්‍යම පළාත් සභාවේ හා පළාත් පාලන ආයතනවල ප්‍රතිපත්තිමය හේතුවලට යටත්ව, ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් තමාට පැවරෙන රාජකාරියෙහි සත්‍ය වශයෙන්ම සේවය කරන කාල සීමාවයි.

ix. "ක්‍රියාත්මක වන දිනය" යනුවෙන් අදහස් කරනුයේ, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් මෙම උසස් කිරීමේ පරිපාටිය අනුමත කරනු ලබන දිනය වේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ මධ්‍යම පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීතිරීති හා රෙගුලාසි අදාළ වේ.

16. මෙම උසස් කිරීමේ පරිපාටියෙහි සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් පැන නගින ගැටලුවක දී මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමා විමසා, ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි තීරණය කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025 . 04 . 03 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

අතුරු වෛද්‍ය සේවාවේ III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත්‍රය.

I කොටස : අදාල නිලධාරිනිය විසින් ම සම්පූර්ණ කළ යුතු ය.

1. තනතුර :-...
2. සේවා ස්ථානය :-...

3. (අ) නිලධාරිනියගේ මුලකුරු සමග නම:-...
(ආ) සම්පූර්ණ නම :-...
....
(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය :-...
(ඈ) උපන් දිනය :-...
(ඉ) කාර්යාලයීය ලිපිනය :-...
(ඊ) පෞද්ගලික ලිපිනය :-...
(උ) දුරකථන අංකය :-...

4. (අ) සුහුඅවට බැඳුණු දිනය :-...
(ආ) II"ආ" ඛණ්ඩයේ / III ශ්‍රේණියේ පත්වීම් ලද දිනය:-...
(ඇ) II"ආ" ඛණ්ඩයේ / III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් දිනය/දිනයන්:-...................
....
(ඈ) II"ආ" ඛණ්ඩයේ / III ශ්‍රේණියේ පත්වීම ස්ථිර කරන ලද දිනය:-...
(ඉ) II"ආ" ඛණ්ඩයේ / III ශ්‍රේණියේ වසර දහය (10)ක සක්‍රිය සේවා කාලය සම්පූර්ණ වන දිනය:-........

5. II"ආ" ඛණ්ඩයේ / III ශ්‍රේණියේ වසර දහය (10)ක සක්‍රිය සේවා කාලය තුළ,
(අ) සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබේද? ....
(ආ) එසේ නොමැති නම් ඊට හේතු. :-...
....

6. II"ආ" ඛණ්ඩයේ / III ශ්‍රේණියේ වසර දහය (10)ක සක්‍රිය සේවා කාලය තුළ,
(අ) වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර:-...
....
....

7. (අ) උසස්වීම් දිනට පූර්වාසන්න වසර පහක (05) සේවා කාලය තුළ විනය පරීක්ෂණ හෝ විනය දඬුවම් කිසිවක් ලබා තිබේද?...
(ආ)ඔව් නම් ඒ පිළිබඳ විස්තර :-...
....

8. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර ඇති දිනය :- ....

ඉහත අංක 01 සිට 08 දක්වා සඳහන් විස්තර මාගේ දැනීම සහ විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

....	ගරු ආණ්ඩුකාරතුමා විසින් 2025 - 04 - 03 දින අනුමත කරන ලදී.	....
දිනය	ආණ්ඩුකාර ලේකම්	නිලධාරිනියගේ අත්සන.

2 කොටස : විෂය භාර නිලධාරි විසින් අදාළ නිලධාරිනියගේ පෞද්ගලික ලිපිගොනුව අනුව සම්පූර්ණ කළ යුතුය.

ඉහත නිලධාරිනියගේ පෞද්ගලික ලිපිගොනුව අනුව, අයදුම්පතේ 1 සිට 8 දක්වා ඇති සියලුම තොරතුරු නිවැරදි බව මෙයින් සහතික කරමි.

....

දිනය.   විෂය භාර නිලධාරියාගේ අත්සන

3 කොටස : ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුර දරන .... මිය/මෙනෙවිය සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බවත්, ඇය පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරේ III ශ්‍රේණියේ වසර හය (06)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලය .... දිනට සම්පූර්ණ කර ඇති බවත්, III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්/අසමත් බව සහතික කරන බවත්, දැනට විනය පරීක්ෂණ කටයුතු ඇති/නැති බවත්, ඉදිරියේදී විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කරන/නොකරන බවත් .... දින සිට අතුරු වෛද්‍ය සේවාවට අයත් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරේ II ශ්‍රේණියට උසස් කිරීම සුදුසු/නුසුදුසු බවත් නිර්දේශ කරමි.

....

දිනය.   ආයතන ප්‍රධානියා.
අත්සන හා නිල මුද්‍රාව

4 කොටස : පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ නිර්දේශය

ඉහත නම සඳහන් නිලධාරිනිය .... දින සිට II ශ්‍රේණියට උසස් කිරීම සුදුසු බව/නුසුදුසු බව නිර්දේශ කර ඉදිරිපත් කරමි.

....

දිනය.   පළාත් පාලන සහකාර කොමසාරිස්.
අත්සන හා නිල මුද්‍රාව

5 කොටස : පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය

ඉහත නම සඳහන් නිලධාරිනිය.................................. දින සිට II ශ්‍රේණියට උසස් කිරීම අනුමත කරමි.

....

දිනය   පළාත් පාලන කොමසාරිස්.
අත්සන හා නිල මුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025.04.03 දින
අනුමත කරන ලදී.
....
ආණ්ඩුකාර ලේකම්

අතුරු වෛද්‍ය සේවාවේ II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම සඳහා අයදුම්පත්‍රය.

I කොටස : අදාළ නිලධාරිනිය විසින් ම සම්පූර්ණ කළ යුතු ය.

1. තනතුර :-..
2. සේවා ස්ථානය :-..
3. (අ) නිලධාරිනියගේ මුලකුරු සමග නම:-..
   (ආ) සම්පූර්ණ නම :-..
   ....
   (ඇ) ජාතික හැඳුනුම්පත් අංකය :-..
   (ඈ) උපන් දිනය :-..
   (ඉ) කාර්යාලයීය ලිපිනය :-..
   (ඊ) පෞද්ගලික ලිපිනය :-..
   (උ) දුරකථන අංකය :-..

4. (අ) පුහුණුවට බැඳුණු දිනය :-..
   (ආ) II"ආ" බණ්ඩයේ / III ශ්‍රේණියේ පත්වීම ලද දිනය:-..
   (ඇ) II"ආ" බණ්ඩයේ / III ශ්‍රේණියේ පත්වීම ස්ථිර කරන ලද දිනය:-..
   (ඈ) II"අ" බණ්ඩයේ / II ශ්‍රේණියට උසස් කරන ලද දිනය :-..
   (ඉ) II"අ" බණ්ඩයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් දිනය/දිනයන් :-..
   ....
   (ඊ) II බණ්ඩයේ II ශ්‍රේණියේ වසර දහයක (10)ක සක්‍රිය සේවා කාලය සම්පූර්ණ වන දිනය :-..................

5. II"අ" බණ්ඩයේ / II ශ්‍රේණියේ වසර දහය (10)ක සක්‍රිය සේවා කාලය තුළ,
   (අ) සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබේද? ....
   (ආ) එසේ නොමැති නම් ඊට හේතු. :-..
   ....

6. II"අ" බණ්ඩයේ / II ශ්‍රේණියේ වසර දහය (10)ක සක්‍රිය සේවා කාලය තුළ ලබාගෙන ඇති වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර:-..
   ....
   ....

7. (අ) උසස්වීම දිනට පූර්වාසන්න වසර පහක (05) සේවා කාලය තුළ විනය පරීක්ෂණ හෝ විනය දඬුවම කිසිවක් ලබා තිබේද?..
   (ආ)ඔව් නම් ඒ පිළිබඳ විස්තර :-..
   ....

8. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර ඇති දිනය :- ....

ඉහත අංක 01 සිට 08 දක්වා සඳහන් විස්තර මාගේ දැනීම සහ විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

....
දිනය. නිලධාරිනියගේ අත්සන.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025-04-22 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

2 කොටස : විෂය භාර නිලධාරී විසින් අදාළ නිලධාරිනියගේ පෞද්ගලික ලිපිගොනුව අනුව සම්පූර්ණ කළ යුතුය.

ඉහත නිලධාරිනියගේ පෞද්ගලික ලිපිගොනුව අනුව අයදුම්පතේ 1 සිට 8 දක්වා ඇති සියලුම තොරතුරු නිවැරදි බව මෙයින් සහතික කරමි.

....

දිනය. විෂය භාර නිලධාරියාගේ අත්සන

3 කොටස : ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි තනතුර දරන.. මිය/මෙනෙවිය මහත්මියගෙන් ඉහත දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බවත්, ඇය පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි තනතුරේ II ශ්‍රේණියේ වසර දහය (10)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලය .... දිනට සම්පූර්ණ කර ඇති බවත්, II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්/අසමත් බව සහතික කරන බවත්, දැනට විනය පරීක්ෂණ කටයුතු ඇති/නැති බවත්, ඉදිරියේදී විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කරන/නොකරන බවත් .... දින සිට අතුරු වෛද්‍ය සේවාවට අයත් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරේ I ශ්‍රේණියට උසස් කිරීම සුදුසු /නුසුදුසු බවත් නිර්දේශ කරමි.

....

දිනය. ආයතන ප්‍රධානියා.
අත්සන හා නිළ මුද්‍රාව

4 කොටස : පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ නිර්දේශය

ඉහත නම සඳහන් නිලධාරිනිය .... දින සිට I ශ්‍රේණියට උසස් කිරීම සුදුසු බව/නුසුදුසු බව නිර්දේශ කර ඉදිරිපත් කරමි.

....

දිනය. පළාත් පාලන සහකාර කොමසාරිස්.
අත්සන හා නිළ මුද්‍රාව

5 කොටස : පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය

ඉහත නම සඳහන් නිලධාරිනිය .... දින සිට I ශ්‍රේණියට උසස් කිරීම අනුමත කරමි.

....

දිනය. පළාත් පාලන කොමසාරිස්.
අත්සන හා නිළ මුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2015.04.03 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ
අතුරු වෛද්‍ය සේවා ගණය (MT-5-2016) පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරු සඳහා වන
උසස් කිරීමේ පරිපාටිය අනුව නිලධාරිනීන් අන්තර්ග්‍රහණය කිරීම සඳහා වූ අයදුම්පත්‍රය.

I කොටස : නිලධාරිනිය විසින් සම්පූර්ණ කළ යුතුයි.

1. සම්පූර්ණ නම:..
   ....
2. මුලකුරු සමග නම:..
3. මුලකුරු වලින් හැඳින්වෙන නම:..
   ....
4. උපන් දිනය:-..
5. ජාතික හැඳුනුම්පත් අංකය :..
6. දැනට සේවය කරන ස්ථානය:..
7. මුල් පත්වීම් ලිපියේ අංකය හා මුල් පත්වීම් දිනය:..
8. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය වූ දිනය:..
9. පත්වීම ස්ථිර කළ දිනය:..
10. දැනට දරන ශ්‍රේණිය: ....
11. එම ශ්‍රේණියට පත්වූ දිනය:..
12. III, II, I කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ දිනය:- III.................. II.................. I..................
13. උසස් කිරීමේ පරිපාටිය අනුමත කරන දිනට මුළු සේවා කාලය:-..
14. උසස් කිරීමේ පරිපාටිය අනුමත කරන දිනට රා.පරි.ච.ලේ. 3/2016 අනුව වැටුප් පියවර:-..................
15. වැටුප් වර්ධක දිනය :-................................ (අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ නිලධාරිනියගේ වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයන්හි වෙනසක් සිදු නොවිය යුතු ය)
16. නව උසස් කිරීමේ පරිපාටිය අනුව අන්තර්ග්‍රහණය වීමට අයදුම්කරන ශ්‍රේණිය:-..............................

මා විසින් ඉහත සඳහන් කර ඇති සියළුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. මධ්‍යම පළාතේ පාලන දෙපාර්තමේන්තුවේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුර සඳහා නව උසස් කිරීමේ පරිපාටිය අනුව අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරමි/ නොකරමි.

දිනය:-.. අයදුම්කරුගේ අත්සන:-........................

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2023-04-03 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

2 කොටස : විෂය භාර නිලධාරි විසින් අදාළ නිලධාරිනියගේ පෞද්ගලික ලිපිගොනුව අනුව සම්පූර්ණ කළ යුතුය.

ඉහත නිලධාරිනියගේ පෞද්ගලික ලිපිගොනුව අනුව අයදුම්පතේ 1 සිට 8 දක්වා ඇති සියලුම තොරතුරු නිවැරදි බව මෙයින් සහතික කරමි.

....

දිනය. විෂය භාර නිලධාරියාගේ අත්සන

3 කොටස : ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියක ලෙස සේවය කරන .... මහත්මිය/ මෙනවිය විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව සත්‍ය හා නිවැරදි බවත් ....දින .... ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බව සහතික කරමි.

....

දිනය. ආයතන ප්‍රධානියා,
අත්සන හා නිල මුද්‍රාව

4 කොටස : පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ නිර්දේශය

මෙම නිලධාරිනිය අන්තර්ග්‍රහණය වීමට අදාළ සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත/නැත. එබැවින් .... දින සිට .... ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි /නොකරමි.

....

දිනය. පළාත් පාලන සහකාර කොමසාරිස්,
අත්සන හා නිල මුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025-04-23 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

5 කොටස : පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශය

මෙම නිලධාරිනිය අන්තර්ග්‍රහණය වීමට අදාළ සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත/නැත. එබැවින් ....දින සිට........... ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම නිර්දේශ කරමි/නොකරමි.

....

දිනය.

පළාත් පාලන කොමසාරිස්.

අත්සන හා නිල මුද්‍රාව

6 කොටස : අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය

.... මහත්මිය/මෙනවිය අන්තර්ග්‍රහණය වීමට අදාළ සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇත/නැත. එබැවින් .... දින සිට ....ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම අනුමත කරමි/නොකරමි.

....

දිනය.

අමාත්‍යාංශ ලේකම්.

අත්සන හා නිල මුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමා විසින්

...2025-04-03... දින

අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

අනු අංකය	පළාත් පාලන ආයතනයේ නම	අනුමත ප.සෞ.සේ.නි. සංඛ්‍යාව.	පැවරෙන කාර්යයන්.
1	මහනුවර මහ නගර සභාව	24	මාතෘ හා ළමා සෞඛ්‍ය සංවර්ධනය මූලික කොට ඇති සෞඛ්‍ය අධ්‍යාපනය ලබා දීම, ප්‍රාථමික සෞඛ්‍ය ප්‍රවර්ධනය හා සම්බන්ධව සියලු රාජකාරි. ඵලදායි පවුල් හඳුනා ගැනීම, පූර්ව/පසු ප්‍රසව සංරක්ෂණය, දරු ප්‍රසූතියේ දී මවගේත්, නව ජන්මයාගේත් පූර්ණ ආරක්ෂාව සැලසෙන පරිදි ප්‍රසූතිය සම්පූර්ණ ලෙස සිදුකිරීම, පවුල් සැලසුම් කටයුතු, මන්දපෝෂණය වැළැක්වීමට ක්‍රියා කිරීම, බර අඩු ළදරුවන්ගේ වර්ධනයෙහි ලා පියවර ගැනීම වශයෙන් ළදරු, ළමා ප්‍රතිශක්තීකරණ කටයුතු, බෝවන රෝග අරබයා එන්නත් දීම වැනි සියලු කටයුතු.
2	ගම්පල නගර සභාව	6	
3	නාවලපිටිය නගර සභාව	2	
4	මාතලේ මහ නගර සභාව	8	
5	නුවරඑළිය මහ නගර සභාව	5	
6	දඹුල්ල මහ නගර සභාව	2	
7	හැටන් දික්ඔය නගර සභාව	2	
8	තලවාකැලේ ලිඳුල නගර සභාව	1	
	එකතුව	**50**	

සටහන - අනුමත පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනීන් සංඛ්‍යාව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් වරින්වර සිදුකරනු ලබන අනුමත සේවක සංඛ්‍යා සංශෝධනයන් අනුව වෙනස් වේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025 - 04 - 03 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

01.විභාගයේ නම : අකුරු වෛද්‍ය සේවයේ III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

1.1 අමාත්‍යාංශය : මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය.

1.2 නිලධර ගණය : අකුරු වෛද්‍ය සේවය

02. විභාගය පිළිබඳ විස්තර.

ප්‍රශ්න පත්‍රය	පිළිතුරු සැපයිය යුතු ආකාරය	කාලය	මුළු ලකුණු	සමත් ලකුණු
ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති	රචනා ප්‍රශ්න 8කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 5 කට පිළිතුරු සැපයිය යුතුය.	පැය 03	100	40%
මුදල් රෙගුලාසි	රචනා ප්‍රශ්න 8කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 5 කට පිළිතුරු සැපයිය යුතුය.	පැය 03	100	40%

03. විභාගය පවත්වනු ලබන බලධරයා : දේශීය සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග :වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
ආයතන සංග්‍රහය	ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ හා II වැනි කාණ්ඩයේ පහත සඳහන් පරිච්ඡේද මත ප්‍රශ්න පත්‍රය සැකසේ. IV, XII, XIII, XIV,XIX, XLVII, XLVIII
මුදල් රෙගුලාසි	මෙම ප්‍රශ්න පත්‍රය පහත සඳහන් මුදල් රෙගුලාසි මත සැකසේ. I වන පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම. (මුදල් රෙගුලාසි 1 සිට 68 දක්වා) III වන පරිච්ඡේදය - මූල්‍ය කළමනාකරණය හා උත්තරදායී බව, ප්‍රධාන ගණක නිලධාරි, ගණක නිල ආදායම් ගිණුම් නිලධාරීන්, ගෙවීම සඳහා බලය ලබාදීම,අනුමත කිරීම, සහතික කිරීම , කාර්යය පැවරීම (මුදල් රෙගුලාසි 124 සිට 147 දක්වා)

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2025-04-03 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

01.විභාගයේ නම :අතුරු වෛද්‍ය සේවයේ II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

1.1 අමාත්‍යාංශය : මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය.

1.2 නිලධර ගණය : අතුරු වෛද්‍ය සේවය

02. විභාගය පිළිබඳ විස්තර.

(අ) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය:

ප්‍රශ්න පත්‍රය	පිළිතුරු සැපයිය යුතු ආකාරය	කාලය	මුළු ලකුණු	සමත් ලකුණු
ආයතන සංග්‍රහය	රචනා ප්‍රශ්න 7කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 4 කට පිළිතුරු සැපයිය යුතුය.	පැය 03	100	40%
මුදල් රෙගුලාසි	රචනා ප්‍රශ්න 7කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 4 කට පිළිතුරු සැපයිය යුතුය.	පැය 03	100	40%

(ආ) දෙපාර්තමේන්තු පරීක්ෂණය:

ප්‍රශ්න පත්‍රය	පිළිතුරු සැපයිය යුතු ආකාරය	කාලය	මුළු ලකුණු	සමත් ලකුණු
විෂයානුබද්ධ ලිඛිත	රචනා ප්‍රශ්න 7කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 4 කට පිළිතුරු සැපයිය යුතුය.	පැය 03	100	40%
විෂයානුබද්ධ වාචික	විෂය ක්ෂේත්‍රය ඇසුරින් සහ රාජකාරියේදී මුහුණපාලන ගැටළු පිළිබඳව වාචිකව කරනු ලබන පරීක්ෂණය.	විනාඩි 15	100	40%
විෂයනුබද්ධ ප්‍රායෝගික	විෂය ක්ෂේත්‍රය ඇසුරින් ප්‍රායෝගිකව කරනු ලබන පරීක්ෂණය.	පරීක්ෂණය අනුව	100	40%

03. විභාගය පවත්වනු ලබන බලධරයා : රෙජීය සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග :වසරකට දෙවරක්.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
......2025..04..03.... දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය

ප්‍රශ්න පත්‍රයේ නම.	විෂය නිර්දේශය.
ආයතන සංග්‍රහය.	ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ හා II වැනි කාණ්ඩයේ පහත සඳහන් පරිච්ඡේද මත ප්‍රශ්න පත්‍රය සැකසේ. ආයතන සංග්‍රහයේ පරිච්ඡේද - XV, XVI, XXIII, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII.
මුදල් රෙගුලාසි	මුදල් රෙගුලාසි පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ. (1) VI වන පරිච්ඡේදය. ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරත්වය - අග්‍රිම හා වෙනත් ගිණුම්, රාජ්‍ය මූල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව ඇතුළු ගිණුම් (මුදල් රෙගුලාසි 315 සිට 396 දක්වා) (2) XIII වන පරිච්ඡේදය. සැපයුම් වැඩ හා සේවා - සැපයීම /මිලට ගැනීමේ ක්‍රියාවලිය, ගබඩා සමීක්ෂණ, ගබඩාකරණ ක්‍රියාවලිය, කොන්ත්‍රාත්, සේවාවන් පරිබාහිරයෙන් ලබා ගැනීම.(මුදල් රෙගුලාසි 708 සිට 775 දක්වා).
විෂයානුබද්ධ පරීක්ෂණය ලිඛිත විභාගය.	මාතෘ සංරක්ෂණය, ළදරු ළමා සංරක්ෂණය, පෝෂණය, ප්‍රතිශක්තිකරණය, පවුල් සංවිධානය, සෞඛ්‍ය අධ්‍යාපනය, ළමා මානසික සෞඛ්‍යය, දන්ත සෞඛ්‍යය, බෝවන රෝග, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා වැඩ තක්සේරු කිරීම
විෂයානුබද්ධ පරීක්ෂණය ප්‍රායෝගික පරීක්ෂණය.	විෂයානුබද්ධ ලිඛිත ප්‍රශ්න පත්‍රයට අදාළ විෂය නිර්දේශය ප්‍රායෝගික පරීක්ෂණවලටද අදාල වේ.
විෂයානුබද්ධ පරීක්ෂණය වාචික පරීක්ෂණය.	විෂයානුබද්ධ ලිඛිත ප්‍රශ්න පත්‍රයට අදාළ විෂය නිර්දේශයට අදාළව හා සේවයේ යෙදීමේ දී එළඹිය හැකි ගැටලු පිළිබඳ වාචික පරීක්ෂණයකි.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2025 - 04 - 03 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

01.විභාගයේ නම :අතුරු වෛද්‍ය සේවයේ I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

1.1 අමාත්‍යාංශය : මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය.

1.2 නිලධර ගණය : අතුරු වෛද්‍ය සේවය

02.විභාගය පිළිබඳ විස්තර.

ප්‍රශ්න පත්‍රය	පිළිතුරු සැපයිය යුතු ආකාරය	කාලය	මුළු ලකුණු	සමත් ලකුණු
විෂයානුබද්ධ (බහුවරණ)	බහුවරණ ප්‍රශ්න 50 කින් සමන්විත වේ.	පැය 02	50	40%
විෂයානුබද්ධ (ව්‍යුහගත රචනා)	පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර ඉතිරි ප්‍රශ්න 5 න් 3කට පිළිතුරු සැපයිය යුතුය.	පැය 02	50	40%

03. විභාගය පවත්වනු ලබන බලධරයා : පළාත් සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්.

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග : වසරකට දෙවරක්.

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය.

ප්‍රශ්න පත්‍රයේ නම	විෂය නිර්දේශය
විෂයානුබද්ධ (බහුවරණ) විෂයානුබද්ධ (ව්‍යුහගත රචනා)	1.මාතෘ සෞඛ්‍ය, 2. ළදරු ළමා සංරක්ෂණය, 3.ප්‍රතිශක්තිකරණය, 4.පවුල් සංවිධානය, 5.සෞඛ්‍ය අධ්‍යාපනය, 6.සැලසුම් කිරීම ,ක්‍රියාත්මක කිරීම හා වැඩ තක්සේරු කිරීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2016..04..03.. දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- නිර්දේශ කරමු.

1. ගාමිණී රාජකරුණා මහතා (සභාපති) ....

2. පී.ටී.ජී.ගුණතිලක මහතා (සාමාජික) ....

3. සී.පී.එස්.ඉලංගසිංහ මහතා (සාමාජික) ....

4. ටී.බී.එම්.එස්.බී. තෝරදෙණිය මහත්මිය (සාමාජික) - absent -

5. පී.එල්.පී. තිස්ස පී. මාරගෙල මහතා (සාමාජික) - absent -

දිනය : 2025.03.12

ආණ්ඩුකාර ලේකම ,

2025.03.12 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 2025/525 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද "මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ අතුරු වෛද්‍ය සේවා ගණය (MT-5-2016) පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරු සඳහා වන උසස් කිරීමේ පරිපාටිය" ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය : 2025/03/27 ....

ලේකම ,
රාජ්‍යසේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

නිල මුද්‍රාව.

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය:- අනුමත කරමි. / නොකරමි.

2025.04.05

සරත් බී.එස්. අබයකෝන්
(B.Sc.Eng, M.A.Sc., Ph.D, CEng, IntPE, FIESL, FNASSL)
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය